දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ අංක : 21 /2012

මගේ අංකය - කේ.03/51/ 230 /12
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2012.11.[illegible]වෙනි දින.

සියලුම බන්ධනාගාර අධිකාරින්,
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත.

## 2013 වසරට ආගමික වතාවත් සඳහා පූජකවරුන් පත්කිරිම.

2013 වසර සඳහා දිවයිනේ සියලුම බන්ධනාගාර වල ඒ ඒ ආගමික සිරකරුවන් හට ආගමික වතාවත් සිදු කිරිම සඳහා පූජකවරුන් පත්කල යුතුව ඇත.

02. ඒ සඳහා පහත සඳහන් ආදර්ශයට අනුව , සකස්කල ආගමික පූජකවරුන්ගේ නාම ලේඛණයක් 2012.12.15 වෙනි දිනට පෙර ඔබගේ නිර්දේශය සහිතව මා වෙත එවිය යුතුය.

03. දැනට පත්කර ඇති පූජකවරුන්ගේ නිල කාලය 2012.12.31 වෙනි දිනට අවසන්වන බැවින් 2013 වසරට පූජකවරුන් පත් කිරිමට අවශ්‍ය විස්තර සැපයිමට ආයතන භාර අධිකාරි වරයා / සහකාර අධිකාරි වරයා විසින් වහ බලා ගත යුතුය. 2012 වර්ෂයට පත්කරන ලද පූජකවරුන් කීවරක් බන්ධනාගාරයට පැමිණ ආගමික වැඩසටහන් ඉටුකලාද , නැද්ද යන්න සහ ඒ අනුව ඔවුනගේ ආගමික මෙහෙවර තවදුරටත් බන්ධනාගාරයට ප්‍රයෝජනවත්ද යන්න පිළිබඳව ඇගයිමක් කොට එම පූජකවරුන්ගේ සේවය සම්බන්ධව ඔබ සෑහිමකට පත් නොවන්නේ නම් ඔවුන්ගේ නම ඉවත් කිරීමට හේතුද , දැක්විය යුතුය. එසේ අළුතින් පත්කරනු ලබන පූජකවරුන් වේ නම් මොවුන් පත්කිරිමට හේතුවන කරුණුද සංශිප්තව සටහන් කලයුතුය. සියළුම සිරකරුවන් / සැකකරුවන් වෙනුවෙන් ඔවුන් අදහන ආගම අනුව , පූජකවරුන් පත් කිරිම සඳහා අවශ්‍ය විස්තර සැපයිම ආයතන භාර අධිකාරි/සහකාර අධිකාරි වරයාගේ වගකිමක් බව සඳහන් කරමි.

04. එල්.ටී.ටී.ඊ සැකකරුවන් රඳවා සිටින ආයතන සඳහා පත් කිරිමට නිර්දේශ පූජකවරුන් වෙනුවෙන් පොලිස් වාර්ථා ලබා ගෙන අදාල නාම ලේඛන සමඟ ඉදිරිපත් කිරිමට ආයතන භාර අධිකාරි වරයා විසින් කටයුතු කල යුතුය.

05. පසුගිය වසරේ පත්කරන ලද පූජකවරුන්ගේ නම් ලැයිස්තුවට අනුව , ආගමික කටයුතු පැවැත්විම සඳහා එක් එක් ආගම වෙනුවෙන් පත්කරනු ලබන පූජකවරුන් සංඛ්‍යාව එම ආගමේ ප්‍රධාන පූජකවරයා සමඟ සාකච්ඡා කර තෝරා ගෙන අදාල නම් පමණක් ආයතන භාර අධිකාරි වරයාගේ නිර්දේශය සහිතව පහත ආකෘතියේ සඳහන් ආකාරයට එවිමට කටයුතු කල යුතුය.

06. 2012 වසර සඳහා පූජකවරුන් පත් කිරිමේ නාම ලේඛණය නියමිත දිනට මූලස්ථානයට නොලැබිම හේතුවෙන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දිමට සිදුවිය. එබැවින් , 2013 වසර සඳහා පූජකවරුන් පත් කිරිමේ නාම ලේඛනයක් නියමිත දිනට එවිමට ඔබ විසින් වහ බලාගත යුතු බවට මෙයින් දන්වමි.

පි. ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

2013 වසර සඳහා පූජකවරුන් පත් කිරිම

........................................ බන්ධනාගාරය

| බෞද්ධ | කතෝලික | ඉස්ලාම් | මෙතෝදිස්ත | හින්දු | වෙනත් ආගම් |
|---|---|---|---|---|---|
| | | | | | |